*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

## පෙරදිග සංගීතය

**7 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සප්තකයේ ඇති අචල ස්වර දෙක මොනවා ද?

(i) ස, ම (ii) ම, ප (iii) ස, ප (iv) ග, නි

02 සප්තකය තුළ ඇති කෝමළ හා තීව්‍ර ස්වරවල එකතුව වනුයේ,

(i) දෙකකි (ii) තුනකි (iii) හතරකි (iv) පහකි

03 ස්වර නාම හා ස්වර සංකේත නිවැරදිව දක්වෙන පිලිතුර වනුයේ,

(i) රිෂභය - නි (ii) පංචමය - ම (iii) ගාන්ධාරය - රි (iv) ධෛවතය - ධ

04 ස්වර පුවරු වාදන භාණ්ඩයක් **නොවන්නේ** මින් කුමක් ද?

(i) පියානෝව (ii) මවුත් ඕගනය (iii) එකෝඩියනය (iv) සර්පිනාව

05 ස්වර පුවරුවේ කලු යතුරුවලින් දක්වෙන්නේ,

(i) විකෘති ස්වරයි (ii) උච්ච ස්වරයි (iii) ශුද්ධ ස්වරයි (iv) අචල ස්වරයි

06 සරි සගරි ..... රිග රිමග ....... යන ස්වර අභ්‍යාසයේ ඊලගට යෙදිය යුතු ස්වර කාණ්ඩය වනුයේ,

(i) සරි සගරි ..... (ii) රිම රිගරි ...... (iii) ගම ගපම ..... (iv) ගම ගරිස ......

07 / ධ ගෙ / න ති / න ක / ධි න / යනු,

(i) ත්‍රිතාලය යි (ii) දාදරා තාලය යි
(iii) කෙහෙර්වා තාලය යි (iv) ලාවනී තාලය යි

08 දාදරා තාලයට සමාන දේශිය තිත් රූපය වන්නේ,

(i) මැදුම් තනි තිත ය (ii) මැදුම් මහ දෙතිත ය
(iii) සුලු තනි තිත ය (iv) මහ තනි තිත ය

09 බංකු රබාන වාදනය කරන අවස්ථාවකි

(i) වෙසක් උත්සවය (ii) සිංහල අලුත් අවුරුදු උත්සවය

(iii) ක්‍රීඩා උත්සවය (iv) නත්තල් උත්සවය

10 සංගීතයේ දී කාලය මනින මිම්ම,

(i) විභාග වේ (ii) නාදය වේ (iii) ස්වර වේ (iv) තාලය වේ

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.**

( ගී අනුවාදනය / දැල් ගී / තිත්, තෙයි / ළමා ගීත / උපදේශාත්මක )

11 ගුවන් විදුලියේ ප්‍රචලිත, සරල නාද රටා සහ සරල පද මාලාවන්ගෙන් යුක්ත වීම ........................................................................................ වල ලක්‍ෂණයකි.

12 ගායනයෙන් තොරව ගීතයේ නාද මාලාව වාදනය කිරීම ...................................................................... නම් වේ.

13 තාලම්පටින් ........................................................................................................ යන අක්‍ෂර වාදනය කළ හැකි ය.

14 '' පාන්කිරිත්තා තක්කිට තරිකිට '' යන ගීතය ........................................................................................ ගීතයකි.

15 අර්ථ විරහිත පද යොදා ගනිමින් ධීවරයෝ ගායනා කරන ගීත විශේෂය ............................................................ නම් වේ.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 මන්ද්‍ර, මධ්‍ය හා උච්ච යනු ත්‍රිවිධ ලය ප්‍රභේද වේ. ( )

17 කෝලම් ගීත ගායනයේ දී පහතරට බෙරය වාදනය කරයි. ( )

18 ''මේ උදාර ලංකා භූමියයි.....'' දේශාභිමානි ගීතයකි. ( )

19 ලඝු අකුරක වටිනාකම මාත්‍රා දෙකකි. ( )

20 තබ්ලාව ගී අනුවාදනය සඳහා යොදාගන්නා ස්වර වාද්‍ය භාණ්ඩයකි. ( )

## II - කොටස

- ප්‍රශ්න 03 ක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

01

| A - දන්න වංහුං අපි | B - දම්වැසි වස්සන ලෝකේ | C - අඹ දඹ නාරං |
|---|---|---|

(i) ඉහත ගීත ඇතුළත් නාට්‍ය විශේෂය හඳුන්වන නාමය කුමක් ද? (ල. 02)

(ii) C - ගීතය ඇතුළත් නාට්‍යයේ නම ලියන්න. (ල. 02)

(iii) B - ගීතය ඇතුළත් නාට්‍යයේ නිෂ්පාදකවරයා කවු ද? (ල. 02)

(iv) A - B - C - ගීත තුනෙන් ඔබ කැමති එක් ගීතයක මුල් කොටස ලියන්න. (ල. 04)

02 ඔබගේ විෂය නිර්දේශයට අයත් ගී වර්ග කිහිපයක් සහ ගී පාද කිහිපයක් පහත දක්වා ඇත.

| අ - තීරුව | | ආ - තීරුව | |
|---|---|---|---|
| 1 | උපදේශාත්මක ගී ( ) | A | ගම්හිර කාලිංග නුවර |
| 2 | රබන් ගී ( ) | B | සන්තානම් පල්ලි යන්න |
| 3 | නැළවිලි ගි ( ) | C | සමන් වැලේ මල් ජයට පිපිලා |
| 4 | දූල් ගී ( ) | D | අම්ම මාව දොයි කරන්න |
| 5 | ළමා ගී ( ) | E | අතට වෙරළු ඇහිද ගෙනේ |
| 6 | කෝලම් ගී ( ) | F | උරතල කැළ ඔඩිය ලෙන්ද |

(i) ඉහත වගුවේ ''අ'' තිරුවේ හිස්තැනට සුදුසු ගී පාදයේ ඉංග්‍රීසි අක්ෂරය ''ආ'' තීරුවෙන් තෝරා ලියන්න. (ල. 06)

(ii) 'B' ගී වර්ගය ගායනා කරන අවස්ථාව ලියන්න (ල. 02)

(iii) කෝලම් නාට්‍ය පිළිබඳ විශේෂ ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 02)

03 (i) තනි තිතේ ප්‍රභේද කීය ද? (ල. 01)

(ii) එම තිත් ප්‍රභේද නම් කරන්න. (ල. 03)

(iii) එම තිත් වලට සමාන වන හින්දුස්ථානී තාල නම් කරන්න. (ල. 03)

(iv) මාත්‍රා 3න් 3 ට විභාග වන හින්දුස්ථානී තාලය නිවැරදිව ප්‍රස්තාර කරන්න. (ල. 03)

04 සංගීත විෂයට අනුව ග්‍රහ යනු ග්‍රහණය කර ගැනීම හෙවත් අල්ලා ගැනීමයි. ගීත ගායනයේ දි හෝ වාදනයේ දී ග්‍රහ වර්ග තුනකට බෙදා දක්වන බව ඔබ පංති කාමරයේ දී ඉගෙන ගෙන ඇත. ඒ අනුව,

(i) එම ග්‍රහ වර්ග තුන නම් කරන්න (ල. 03)

(ii) එක් එක් ග්‍රහ වර්ගයට උදාහරණ ගී පාදය බැගින් ලියන්න. (ල. 03)

(iii) ඉන් ඔබ කැමති ග්‍රහ දෙකක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

05 (i) ත්‍රිවිධ සප්තකවල ස්වර වෙන් වෙන් ව ලියා දක්වන්න. (ල. 03)

(ii) ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ ඒ මත මධ්‍ය සප්තකයේ කෝමළ හා තීව්‍ර ස්වර ලකුණු කරන්න. (ල. 07)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | iii | 06 | iii | 11 | ළමා ගීත | 16 | × |
| 02 | iv | 07 | iv | 12 | ගී අනුවාදනය | 17 | ✓ |
| 03 | iv | 08 | i | 13 | තිත් තෙයි | 18 | ✓ |
| 04 | ii | 09 | ii | 14 | උපදේශාත්මක | 19 | × |
| 05 | i | 10 | iv | 15 | දූල් ගී | 20 | × |

## II කොටස

01 (i) නූර්ති (ල. 02)

(ii) රාමායනය (ල. 02)

(iii) නීතිඥ චාල්ස් ඩයස් ශූරීන් (ල. 02)

(iv) ගීතයේ මුල් කොටස ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල. 04)

02 (i) 1 C 2 F 3 E 4 B 5 D 6 A (ල. 06)

(ii) දූල් ඇදීමේ දී

(iii) වෙස් මුහුණු පැළඳීම / කාන්තා චරිත පිරිමි විසින් රඟපෑම / පහත රට බෙරය යොදා ගැනීම ආදී ...... නිවැරදි පිළිතුරකට ලකුණු ලබාදෙන්න. (ල. 02)

03 (i) 03 (ල. 01)

(ii) සුළු තනි තිත / මැදුම් තනි තිත / මහ තනි තිත (ල. 03)

(iii) ලාවනී / දාදරා / ත්‍රිතාලය හෝ කෙහෙර්වා තාලය (ල. 03)

(iv) දාදරා තාලය නිවැරදිව ප්‍රස්තාර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ල. 03)

04 (i) සමග්‍රහ / අවග්‍රහ / විෂම ග්‍රහ (ල. 03)

(ii) (ල. 03)

(iii) (ල. 04)

} නිවැරදි පිළිතුර සපයා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

05 (i) මන්ද්‍ර සප්තකය - ස රි ග ම ප ධ නි

මධ්‍ය සප්තකය - ස රි ග ම ප ධ නි

උච්ච සප්තකය - ස රි ග ම ප ධ නි (ල. 03)

(ii) නිවැරදිව පිළිතුරු සපයා ඇත්නම් ලකුනු ලබා දෙන්න. (ල. 07)